# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1434/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/09/2024<br>පැය 1520 |

## මාධ්‍ය නිවේදනය

### ඓතිහාසික  දඹදෙණිය විහාරස්ථානයේ ශ්‍රී දළදා පෙරහර හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම.

ගිරිඋල්ල පොලිස් වසමේ දඹදෙණිය ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික දඹදෙණිය විහාරස්ථානයේ පැවැත්වෙන දළදා පෙරහර මංගල්‍ය 2024.09.07 වන දින රාත්‍රී 08.00 සිට පසුදින අළුයම දක්වා ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ  වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

කුරුණෑගල - කොළඹ 05 මාර්ගයද කුරුණෑගල - මීගමුව 34 මාර්ගයද ගිරිඋල්ල පොලිස් වසම හරහා දිවෙන බැවින් පෙරහර ගමන් ගන්නා කාලය තුල ඉහත මාර්ගයේ රථවාහන ගමනා ගමනය සීමා කරනු ලබන අතර එම මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත විකල්ප මාර්ගය භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

### විකල්ප මාර්ග

- ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට පැමිණෙන සියළුම බර වාහන දම්පැලැස්ස හන්දියෙන් ඇතුල් කර අලව්ව ප්‍රධාන මාර්ගයට යොමු කිරීම.
- ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට පැමිණෙන සැහැල්ලු වාහන මුතුගල හන්දියෙන් ඇතුල් කර අලව්ව මාර්ගයට යොමු කිරීම.
- මීගමු - නාරම්මල මාර්ගයේ නාර්මමල දෙසට ධාවනය කරන සියළු බර වාහන හා සැහැල්ලු වාහන මහරගම හන්දිය හරහා අලව්ව ප්‍රධාන මාර්ගයට යොමු කිරීම.
- මුතුගල- ගිරිඋල්ල අතර දිවෙන වාහන මුතුගල හන්දිය හරහා කුඩගම්මන ප්‍රදේශයෙන් අලව්ව මාර්ගයට ඇතුළු කිරීමට කටයුතු කරනු ඇත.( විකල්ප මාරගය- කිලෝමීටර 05)

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.